# MTIA ප්‍රජා ආධාර වැඩසටහන (CAP)

## ප්‍රධාන ප්‍රවාහන යටිතල පහසුකම් අධිකාරිය (MTIA) ප්‍රධාන ප්‍රවාහන ව්‍යාපෘති සැලසුම් කිරීම, බෙදා හැරීම සහ ඉදිකිරීමේදී ප්‍රවාහනය වැනි කටයුතු වලදී දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කරයි.

ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ MTIA ප්‍රධාන වැඩ කාල සීමාවන්වලදී මිනිසුන්ට ගමනාගමනයට ඇති පහසුවත් ඇතුලත්ව ප්‍රධාන ඉදිකිරීම් ක්‍රියාකාරකම් සහ බාධා කිරීම් ප්‍රවාහන ජාලය හරහා සම්බන්ධීකරණය කිරීම සහතික කරයි. MTIA විසින් වික්ටෝරියා හි ප්‍රධාන ප්‍රවාහන ව්‍යාපෘති 165 කට අධික ප්‍රමාණයක් සිදුකිරීමේ වගකීම දරයි. එය ව්‍යාපෘති කණ්ඩායම් 5 කින් සමන්විත ය:

- හරස් මාර්ග ඉවත්කිරීමේ ව්‍යාපෘතිය
- වික්ටෝරියා හි ප්‍රධාන මාර්ග ව්‍යාපෘති
- ඊසානදිග සම්බන්ධකිරීමේ ව්‍යාපෘතිය
- වික්ටෝරියා හි දුම්රිය ව්‍යාපෘති
- බටහිර පිවිසුම් උමං ව්‍යාපෘතිය

ප්‍රජා ආධාර වැඩසටහන (CAP) යනු මෙම ප්‍රධාන ව්‍යාපෘති ඉදිකිරීමෙන් බලපෑමට ලක් වූ පදිංචිකරුවන්, ව්‍යාපාර හිමිකරුවන් සහ ඔවුන්ගේ සමීපතම පවුල් සඳහා රහසිගත්ව නොමිලේ වෘත්තීය උපදේශන සහාය සේවාවකි.

සුදුසුකම් ලත් මනෝවිද්‍යාඥයින් සහ සමාජ සේවකයින් සමඟ ආරක්ෂිත පරිසරයක් තුළ රැකියාව, ජීවිතය හෝ ඕනෑම පුද්ගලික ගැටළු සාකච්ඡා කිරීමට CAP ඔබට සහාය විය හැක. MTIA මෙම උපකාරක සේවාව ලබා දීම සඳහා ප්‍රමුඛ සෞඛ්‍ය සේවා සපයන්නා වන New View Psychology (NVP) සම්බන්ධ කර ගෙන ඇත.

NVP ස්වාධීන තෙවන පාර්ශවයකි. සේවාව දැඩි ලෙස රහසිගත බව ඔබට සහතික විය හැකිය. NVP අනිවාර්ය රහස්‍යතා පනත් සහ ප්‍රතිපත්ති සහ වෘත්තීය ප්‍රමිති සහ ආචාර ධර්ම සංග්‍රහවලට අනුකූල වේ.

### NVP හට ඔබට සහය විය හැක්කේ කෙසේද?

ඔබගේ ජීවිතයට බලපාන ගැටලු හඳුනා ගැනීමට, ගවේෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට NVP ඔබට උපකාර කරයි, ඒවාට අයත් වන්නේ:

- ආතතිය
- කාංසාව සහ අඩු මනෝභාවය
- කෝපය සහ චිත්තවේගීය නියාමනය
- දුක සහ පාඩුව/ගැලපුම් දුෂ්කරතා
- පවුල් ගැටළු/බලපෑම
- වෙනස්වීම් වලට මුහුණ දීම සඳහා ඇබ්බැහි වීමේ ගැටළු (මත්පැන්, දුම්පානය හෝ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වීම
- මූල්‍ය අපහසුතාව
- ජීවනෝපායට බලපෑම්
- වෙනස්වීම්වලට මුහුණදීමට ඇති දුෂ්කරතාව
- නිදාගැනීමේ ගැටලු
- වෙනත් ස්ථානවලට පදිංචියට යාම
- පාරිසරික ආතතීන් සමඟ කටයුතු කිරීමේ දුෂ්කරතා (ශබ්ද, දූවිලි සහ ඉදිකිරීම් බලපෑම්)

### උපදේශනය සිදුවන්නේ කුමන ස්ථානයකදීද?

CAP විසින් දුරකථන හරහා, වීඩියෝ ක්‍රමවේද හරහා හා වික්ටෝරියා හි පිහිටා ඇති NVP ස්ථානවලදී මුහුණට මුහුණ උපදේශන සිදුකරයි.

### උපදේශකයින් කවුරුන්ද?

NVP හි උපදේශකයින් සුදුසුකම් ලත් මනෝවිද්‍යාඥයින් සහ සමාජ සේවකයින් වන අතර, කර්මාන්තයේ උපරිම ප්‍රතීතනය සහ පළපුරුද්ද ඇත.

### සේවාව සඳහා ගෙවන්නේ කවුද?

MTIA, වික්ටෝරියානු රජය වෙනුවෙන්, MTIA විසින් සපයනු ලබන ප්‍රධාන ප්‍රවාහන යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ බෙදා හැරීම හරහා බලපෑමට ලක් වූ පදිංචිකරුවන්, ව්‍යාපාර හිමිකරුවන් සහ ඔවුන්ගේ සමීපතම පවුල් සඳහා CAP සඳහා පූර්ණ සහනාධාර ලබා දී ඇත.

### මට උපදේශක වැඩසටහන් කීයක් ලබාගත හැකිද?

CAP සේවාවට ප්‍රවේශ වන සෑම නිවසකටම හෝ ව්‍යාපාරයකටම පැයක සැසි හයකට හිමිකම් ඇත.

### කාලය වෙන්කරවා ගන්න

මෙම අංකයට ඇමතීමෙන් ඔබට පහසු වේලාවක සහ ස්ථානයක හමුවීමක් සකසන්න:

**1300 830 687 එමෙන්ම අදාල ව්‍යාපෘති කේතය පවසන්න:**

| ව්‍යාපෘතියේ නම | සේවාලාභී කේතය |
|---|---|
| හරස් මාර්ග ඉවත්කිරීමේ ව්‍යාපෘතිය | CSLX |
| වික්ටෝරියා හි ප්‍රධාන මාර්ග ව්‍යාපෘති | MRPV |
| ඊසානදිග සම්බන්ධකිරීමේ ව්‍යාපෘතිය | NEL |
| වික්ටෝරියා හි දුම්රිය ව්‍යාපෘති | RPV |
| බටහිර පිවිසුම් උමං ව්‍යාපෘතිය | WGTP |